# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය** | **නර්තනය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1යි

★ **අංක 01 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01) ශාන්තිකර්මවල දක්නට ලැබෙන ග්‍රහපන්ති, කඩතුරා, සිරස පාද කවි හඳුන්වනු ලබන්නේ ................ ගායනා ලෙස ය.
   1) තාලාත්මක කවි
   2) ආඝාතාත්මක කවි
   3) අනාඝානාත්මක කවි
   4) ලයාන්විත කවි

02) මහනුවර යුගයේ උඩරට වන්නම් ගායනා වශයෙන් ඉදිරිපත් වූයේ ...................... දී ය.
   1) මඟුල් මඩුවේ දී ය
   2) ඉලංගම් මඩුවේ දී ය
   3) කවිකාර මඩුවේ දී ය
   4) වාහල මඩුවේ දී ය

03) අත්‍යා බෙර ..................... ශාන්තිකර්මයේ දී දක්නට ලැබෙන බෙර වාදන අංගයකි
   1) කොහොඹා කංකාරිය
   2) බලි ශාන්තිකර්ම
   3) දහඅට සන්නිය
   4) දෙවොල් මඩුව

04) පහතරට සින්දු වන්නම් ඉරට්ටියෙන් අවසන් කරන අතර උඩරට හා සබරගමු වන්නම් ...................... නටා අවසන් කරයි.
   1) කස්තිරම
   2) අඩව්ව
   3) කලාසම
   4) සීරුමාරුව

05) නර්තනයක හෝ නාට්‍යයක එක් එක් චරිත වෙස් ගැන්වීම ...................... අභිනයට අයත් වේ.
   1) ආංගික
   2) සාත්වික
   3) වාචික
   4) ආහාර්ය

06) අතීතයේ පණිවිඩ හුවමාරුකර ගැනීම සඳහා වාදනය කළ බෙර වාදන ක්‍රමයකි......................
   1) මඟුල් බෙර
   2) අණ බෙර
   3) රණ බෙර
   4) වද බෙර

07) ගායනය රහිත නර්තන අංගයක් ලෙස ................... හැඳින් වේ.
   1) වන්නම්
   2) තාලම්
   3) සවුදම්
   4) වට්ටම්

08) තාල තැබීමේ දී තාලස්ථාන දැක්වීම ................... නම් වේ.
   1) ආඝාත
   2) අනාඝාත
   3) ආතත
   4) විතත

09) තාල සංකල්පයේ ඇදෙන ස්වර හා නොඇදෙන ස්වර හඳුන්වන්නේ ................... යනුවෙනි.
   1) ලඝු හා ගුරු
   2) ගුරු හා ලඝු
   3) ගුරු හා ප්ලුත
   4) ප්ලුත හා ගුරු

10) අතීතයේ ගායනය සඳහා පමණක් රචනා වී පසුව නර්තනයට යොදගත් ගායනා විශේෂයකි.................
   1) වන්නම්
   2) ප්‍රශස්ති
   3) සේ ගී
   4) ජන ගී

11) ජනකවිවල ලක්ෂණයක් නොවන්නේ
1) විනෝදස්වාදයක් ලැබීම
2) වෘත්තීය ස්වභාවය විස්තර කිරීම
3) සරල වචන භාවිත නොවීම
4) කතුවරයෙක් නොමැති වීම

12) එකැස් බෙරය නමින් හඳුන්වන වාද්‍ය භාණ්ඩයක් වන්නේ
1) රබාන
2) උඩැක්කිය
3) දවුල
4) තම්මැට්ටම

13) නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව අභ්‍යාස කරන සරඹ වනුයේ
1) පා සරඹ
2) ගොඩ සරඹ
3) වන්නම්
4) මණ්ඩි පද

14) ශ්‍රී ලංකාවේ වෘත්තීන් සම්බන්ධව නිර්මාණය වී ඇති ගැමි නැටුම් වන්නේ
1) වේවැල්, චාමර, ගොයම්
2) සවරම්, වේවැල්, ලී කෙළි
3) මෝල් ගස්, කුළු, ගොයම්
4) ගොයම්, චාමර, මෝල් ගස්

15) නර්තනයට භාරතීය ආභාෂය ලැබී ඇති බවට සාධකයක් හමුවන්නේ,
1) ඉබන් බතුතාගේ වාර්තාව වේ.
2) පාහියන් භික්ෂුවගේ වාර්තාවේ.
3) රොබට් නොක්ස් වාර්තා වේ.
4) ස්පිල් බර්ජන් වාර්තා වේ.

16) පොළොන්නරුවේ නර්තනය සඳහා සරස්වතී මණ්ඩපය ඉදිකල රජතුමා වන්නේ,
1) දුටුගැමුණු රජු
2) මහා පරාක්‍රමබාහු රජු
3) භාතිය අභක රජු
4) පණ්ඩුකාභය රජු

17) දුටුගැමුණු රජු රුවන්වැලි සෑය බඳින උත්සවයට ඇතෙකු පිටින් ගිය බව සඳහන් කෘතිය වන්නේ
1) දීපවංශය
2) චූලවංශය
3) මහාවංශය
4) ධාතුවංශය

18) හඟුරන්කෙතල බදුල්ලල මාතලේ දිස්ත්‍රික්කවල ප්‍රචලිත ගැමි නාටකයකි.
1) සොකරි
2) කෝලම්
3) නාඩගම්
4) රූකඩ

19) "වමත සුරත නළලේ අළු ගාගෙන" යන කවියෙන් විස්තර කෙරෙන චරිතය කුමක්ද?
1) සොකරි
2) ගුරුහාමි
3) වෙදරාළ
4) සොන්තානා

20) වන්නි ප්‍රදේශයේ රඟ දක්වන සොකරි නාටකය සඳහා වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයකි.
1) ගැටබෙරය
2) දවුල
3) උඩැක්කිය
4) බුම්මැඩිය

21) පුරුෂ පක්ෂයට වඩාත් විශේෂිත වූ ජන නර්තනය තෝරන්න.
1) කඩු
2) කළගෙඩි
3) චාමර
4) කුළු

22) සිංහල, ද්‍රවිඩ හා මුස්ලිම් ජනයා අතර වඩාත් ජනප්‍රිය ජන නැටුමක් ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත.
1) ලී කෙළි
2) කොහොඹ කළය
3) වේවැල්
4) බුම්මැඩිය

23) ශාන්තිකර්මයක දක්නට ලැබෙන ප්‍රධානතම සැරසිලි වනුයේ,
1) වෙස් අත්ත, තටුව සහ මැස්ස
2) මල් යහන, ඊගහ සහ තටුව
3) වීදිය, යහන සහ තොරණ
4) වීදිය, ඊගහ සහ පොල් පන්දම

24) කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ දී දැකිය හැකි නර්තන අංග දෙකකි.
1) අස්නේ හා වැදි යක්කම
2) කොහොඹා හැල්ල හා අයිලෙ යැදීම
3) අස්නෙ සහ යක්ඇනුම
4) අස්නෙ සහ හගලේ යැදීම

25) කවිකාර මඩුවෙහි උඩරට වන්නම් රචනා කළ බව සඳහන් වන පුද්ගලයෙකි.

1) රම්මොලවක අධිකාරම්
2) ඇහැලේපොළ අධිකාරම්
3) රත්වත්තේ අධිකාරම්
4) මොල්ලිගොඩ අධිකාරම්

★ **ප්‍රශ්න අංක 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත වගුව භාවිත කරන්න.**

| පේළි | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A | පදම් | චෙන්ඩාව | 2 + 4 | තබ්ලාව |
| B | 3 + 4 | 2 + 3 | පරන් | මංජීරා |
| C | මද්දලය | මෘදංගය | 4 + 4 | රාස්ලිලා |

26) කථක් නර්තන සම්ප්‍රදයට අයත් වාද්‍ය භාණ්ඩය සඳහන් වන්නේ

1) C පේළිය 1 තීරුව
2) A පේළිය 1 තීරුව
3) A පේළිය 4 තීරුව
4) C පේළිය 2 තීරුව

27) භාරත නර්තන සම්ප්‍රදයට අයත් නර්තන අංගය ඇතුළත් පිළිතුර තෝරන්න.

1) B පේළිය 3 තීරුව
2) A පේළිය 1 තීරුව
3) C පේළිය 4 තීරුව
4) B පේළිය 4 තීරුව

28) සිංහරාජ වන්නමට අයත් තාල රූපය ඇතුලත් වන්නේ

1) A පේළිය 3 තීරුව
2) B පේළිය 1 තීරුව
3) C පේළිය 3 තීරුව
4) B පේළිය 2 තීරුව

29) මහනුවර දළදා පෙරහැරේ චාරිත්‍ර විධි ආරම්භ වන්නේ

1) දිය කැපීමෙනි
2) කප් සිටුවීමෙනි
3) පූජා පැවැත්වීමෙනි
4) හේවිසි වාදනයෙනි

30) වන්නම් නර්තනයේ දී එහි පද නර්තනයට යොද ගනු ලබන්නේ

1) ප්‍රකාශාත්මක චලන
2) රිද්මයානුකූල චලන
3) තාලානුකූල චලන
4) සංචලන

31) උඩරට නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස්කර ගැනීමට උපයෝගී වන්නේ

1) දොඹින පද සහ ඉලංගම් සරඹ
2) ගොඩ සරඹ හා ඉලංගම් සරඹ
3) පා සරඹ සහ දොඹින පද
4) පා සරඹ සහ ගොඩ සරඹ

32) කරල් හා අක්යාල වෙන් කිරීමේ චාරිත්‍රය සිදුකරනු ලබන ශාන්තිකර්මයකි.

1) දෙවොල් මඩුව
2) පහන් මඩුව
3) කොහොඹා කංකාරිය
4) රටයකුම

33) තනි තිතේ තාල රූපයක තිබිය හැකි අඩුම හා වැඩිම මාත්‍රා ගණන

1) 2 සහ 3
2) 3 සහ 4
3) 4 සහ 2
4) 2 සහ 4

34) "තකට තකට තක තරිකිට කුන්දත් තාතක ජිජිකුද" මෙම කස්තිරම නටනු ලබන්නේ

1) 10 වන ගොඩ සරඹයට
2) 11 වන ගොඩ සරඹයට
3) 9 වන ගොඩ සරඹයට
4) 12 වන ගොඩ සරඹයට

35) අර්ධ චක්‍ර සරඹය යනුවෙන් නර්තනය කරනුයේ

1) පස්වන ගොඩ සරඹයයි
2) අටවන ගොඩ සරඹයයි
3) නවවන ගොඩ සරඹයයි
4) දහවන ගොඩ සරඹයයි

36) දොං ජිංත ගත දොංත මෙම බෙරපදය අයත් වන්නේ

1) මාත්‍රා 2 + 4 තාලයට
2) මාත්‍රා 4 + 3 තාලයට
3) මාත්‍රා 2 + 3 තාලයට
4) මාත්‍රා 3 + 4 තාලයට

37) "සම්මා සම්බුද්ධ ඥානේන ……" යන ගායනය කිනම් ගායන විශේෂයක් ද?

1) නමස්කාර ගායනයකි
2) ග්‍රහපන්ති ගායනයකි
3) ජන ගායනයකි
4) ශ්ලෝකයකි

38) ගැට බෙරයෙහි කොටස් දෙකක් වන්නේ

1) වලයම සහ සුරත් තට්ටුව ය.
2) වෙනිවර සහ සුරත් තට්ටුව ය.
3) මණ්ඩම සහ වෙනිවර ය.
4) මණ්ඩම සහ අඩබෑය ය.

39) උඩරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කල ප්‍රවීන ශිල්පියෙකු වන්නේ

1) සවුරිස් සිල්වා මහතා ය
2) කේ. ඇස්. ප්‍රනාන්දු මහතා ය
3) එස්. පණීභාරත මහතා ය
4) හීන් නිලමේ මහතා ය

40) උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් ආභරණ කීපයකි.

1) උල් උඩය සහ කාගුල් කුට්ටම
2) අවුල් හැරය සහ හැඩ කැල්ල
3) අවුල් හැරය සහ ශිඛා බන්ධනය
4) ශිඛා බන්ධනය සහ කාගුල් කුට්ටම ය